| මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය | | |
|---|---|---|
| තෙවන වාර පරීක්ෂණය - 2018 | | |
| බෞද්ධ ශිෂ්ටාචාරය - I | 12 ශ්‍රේණිය | කාලය පැය දෙකකි |

නම : ................................................................................

## I පත්‍රය

1. මහා බ්‍රහ්මයා විසින් චතුර් වර්ණය නිර්මාණය කර ඒ ඒ වර්ණයට නියමිත කාර්යයකොටස් පැවරීමක් කරන ලදී. මෙහිදී බමුණන්ට පමණක් සුවිශේෂ වූ කාර්ය කීපයක් දැකගත හැකි විය. ඒවා නම්,
    i) දන්දීම, ඉගෙනීම, ප්‍රභූන්ට මෙහෙවර කිරීම
    ii) යාග කිරීම, දන්දීම, වෙළදාම
    iii) යාග කරවීම, දන් පිළිගැනීම, යාග කිරීම
    iv) දන්දීම, රට පාලනය කිරීම, සත්ත්ව පාලනය
    v) ඉගැන්වීම, යාග කිරීම, සත්ත්ව පාලනය

2. වර්ණ ධර්ම සංකල්පය, බ්‍රාහ්මණයෝ හිතුමතයට නිර්මාණය කරන ලද්දකි. එසේ වුවද එය සමාජ පරිණාමීයව සිදු වන්නක් බවට බුදුසමය තුළින් පෙන්වා දෙනු ලබන සූත්‍ර දේශනාව වන්නේ,
    i) චක්කවත්තිසීහනාද සූත්‍රය
    ii) බ්‍රහ්මජාල සූත්‍රය
    iii) සිඟාලෝවාද සූත්‍රය
    iv) අග්ගඤ්ඤ සූත්‍රය
    v) වසල සූත්‍රය

3. බ්‍රාහ්මණ දර්ශනයට අනුව පුද්ගල ජීවිත කාලය ප්‍රධාන කොටස් හතරකට බෙදා දැක්වීය. එම චතුර්විධ ප්‍රතිපදාවන් හඳුන්වන්නේ,
    i) යාගයයි
    ii) ආශ්‍රම ධර්ම පිළිපැදීමයි
    iii) ස්වධර්ම ඉටු කිරීමයි
    iv) වර්ණ ධර්මයට ගරු කිරීමයි
    v) ආගමික සංස්කාර ඉටු කිරීමයි

4. සත්ත්ව ජීවිතය යම්කිසි නියතියකට අනුව ක්‍රියාත්මක වෙයි. මේ නිසා කිසිදු ක්‍රියාවක් තමන් ඉටු කළත්, නොකළත් එයින් කිසිදු විපාකයක් හිමි නොවේ. නියමිත කාලය ඇවෑමෙන් ශුද්ධියට පත්වෙයි. මෙම ඉගැන්වීම ප්‍රකාශ කරන ශාස්තෘවරයා වන්නේ,
    i) පකුධකච්චායන
    ii) පූර්ණකස්සප
    iii) අජිතකේසකම්බලී
    iv) මක්ඛලීගෝසාල
    v) නිගණ්ඨනාථපුත්ත

5. බුද්ධ කාලීන ඉන්දියාවේ පැවති මහා රාජ්‍ය අතුරෙන් අවන්තියේ අගනුවර වන්නේ,
    i) කුසිනාරා නුවර
    ii) උදේනි නුවර
    iii) රජගහනුවර
    iv) සැවැත් නුවර
    v) කොසඹෑ නුවර

6. බ්‍රාහ්මණ ඉගැන්වීමට අනුව, පුද්ගලයාගේ ජීවිතය උපතේ සිට මරණය දක්වා යුග හතරකට බෙදා දක්වා ඇත. එයින් ශිල්ප හදාරා අවසන් කළ යුතු අවධිය වූයේ,

i) සන්‍යාසි අවධියයි
ii) ගෘහස්ථ අවධියයි
iii) බ්‍රහ්මචාරී අවධියයි
iv) අරණ්‍යක අවධියයි
v) වානප්‍රස්ථ අවධියයි

7. ''රජතුමනි කනස්සලු නොවන්න. සිල්වත්ව පතිවත ආරක්ෂා කර සිටින දියණිය රටක් පාලනය කරන පුතුන් බිහිකරාවි''. මෙසේ බුදුරදුන් ප්‍රකාශ කළේ...

i) බිම්බිසාර රජුට ය.
ii) කොසොල් රජුට ය.
iii) සුද්ධෝදන රජුට ය.
iv) උදේනි රජුට ය.
v) අජාසත් රජුට ය.

8. බ්‍රහ්මසහව්‍යතාවය සඳහා ඇති එකම මාර්ගය ලෙස යාගය හඳුන්වා ඇත. එහිදී යාගයේ අධ්‍යක්ෂ තනතුර දරණ පූජකවරයා හඳුන්වන්නේ,

i) යාඥා කාරක
ii) හෝතෘ
iii) අධ්වර්යු
iv) උද්ගාතෘය
v) බ්‍රාහ්මණ

9. පුද්ගල පෞරුෂ සංවර්ධනයට හා ස්වාධීන චින්තනයට හානි පමුණුවන පුබ්බේකතහේතුවාදය, අහේතු අප්පච්චයවාදය, දේව නිර්මාණවාදය වැනි ඉගැන්වීම් ප්‍රතික්ෂේප කිරීමට බුදු සමය ඉදිරිපත් කරන්නේ,

i) කර්මවාදයයි
ii) හේතුඵලවාදයයි
iii) විභජ්ජවාදයයි
iv) පරිමාණවාදයයි
v) අනාත්මවාදයයි

10. භාරතීය ආගමික චින්තනය තුළ ක්‍රමිකව විකාශයට පත් වූ ප්‍රධාන ආගමික සම්ප්‍රදායන් දෙක වූයේ බ්‍රාහ්මණ සම්ප්‍රදාය හා ශ්‍රමණ සම්ප්‍රදායයි. මෙයින් ශ්‍රමණ සම්ප්‍රදායෙහි අනන්‍යතා ලක්ෂණයක් වන්නේ,

i) වේදය වැනි ග්‍රන්ථ පිළිගැනීමයි.
ii) බාහිර පුද පූජා මගින් විමුක්තිය ලද හැකියැයි විශ්වාසි කිරීමයි.
iii) ඥානමාර්ගය අනුගමනය කොට තමා විසින්ම විමුක්තිය ලබාගත යුතු වීමයි.
iv) මිනිසුන් අතර කුල භේදය තිබිය යුතුයැයි පිළිගැනීමයි.
v) අදෘශ්‍යමාන බලවේගයක් පිළිබඳ විශ්වාසයන් තැබීම.

11. බුද්ධ කාලීන භාරතයේ විවිධ ජීවන වෘත්තීන් පැවති බවට සාධක හමුවේ. මෙහිලා වෙළඳ නායකයන් ගැල් සිය ගණන් යොදවා වෙළදාමෙහි යෙදීමද, කොසඹෑ පැළලුප් නුවර සුප්‍රකට වෙළඳ නගර පිළිබඳ තොරතුරු හමුවීම ද භාරුකච්ච වැනි වරායන් ඔස්සේ නැව් මගින් භාණ්ඩ ආයත නිරායාත කිරීම ද වැනි සාධක මගින් ප්‍රකට කෙරෙන්නේ,

i) බුද්ධ කාලීන භාරතයේ භාණ්ඩ ප්‍රවාහනයට ගැල් බහුලව භාවිතා කළ බවයි.
ii) බුද්ධ කාලීන භාරතයේ දියුණු නගර පැවති බවයි.
iii) බුද්ධ කාලීන භාරතය වාණිජකරණයට ලක් වී ඇති බවයි.
iv) නැව් මගින් භාණ්ඩ ආයාත - නිර්යාත කළ බවයි.
v) බුද්ධ කාලීන භාරතයේ විරැකියාව අවම වූ බවයි.

12. සුද්ධෝදන, අමිතෝදන ආදී පුද්ගල නාමයන්ට ''ඕදන'' යන්න යෙදීමෙන් භාරතයේ ජනතාවගේ ප්‍රධාන ආහාරය ''බත'' වූ බව ගම්‍ය වේ. වප්මඟුල් උත්සවයේ දී සිද්ධාර්ථ කුමාරයා ආනාපානසති භාවනාවේ යෙදුණු බවත්, බෞද්ධ මූලාශ්‍රවල සඳහන් වේ. කසී භාරද්වාජ සූත්‍රයේ දැක්වෙන ආකාරයට බමුණන් සී සෑමේ කටයුතු වල යෙදී සිටිය බව සඳහන් වේ. මෙම සමස්ත ඡේදයෙන් පැහැදිලි වන්නේ,

i) සුද්ධෝදන රජු සී සෑමේ නායකත්වය ගත් බවයි.

ii) වප්මඟුල් දා සිදුහත් කුමරු ආනාපානසති භාවනාවේ යෙදී සිටි බවයි.

iii) බමුණන් පවා කෘෂිකර්මාන්තයෙහි යෙදුණු බවයි.

iv) බුද්ධකාලීන භාරතයේ දියුණු කෘෂි ආර්ථික රටාවක් පැවති බවයි.

v) ඕදන පරපුර සුද්ධ වූ බත් ලබා දුන් බවයි.

13. ප්‍රාග් වෛදික යුගයේ පැවති මූලික ආගමික පිළිවෙතක් වූයේ,

i) ඊශ්වර වන්දනයයි.

ii) සති පූජාවයි.

iii) ජගදාත්මය සමග එක්වීමට පිළිවෙත් පිරීමයි.

iv) ජගන්මාතා වන්දනයයි.

v) බ්‍රහ්ම සහව්‍යතාවට පත්වීමට පුද පූජා පැවැත්වීමයි.

14. භාරතයේ ප්‍රධාන පාලන ක්‍රම 2ක් තිබුණු අතර එය රාජාණ්ඩු පාලන ක්‍රමය හා සමූහාණ්ඩු පාලන ක්‍රමය ලෙස හැඳින්වේ. සමූහාණ්ඩු පාලන ක්‍රමය ක්‍රියාත්මක වූ රාජ්‍යයක් වන්නේ,

i) මගධ රාජ්‍යය

ii) කෝසල රාජ්‍යය

iii) වජ්ජි රාජ්‍යය

iv) වත්ස රාජ්‍යය

v) අවන්ති රාජ්‍යය

15. කිසිදු ජාතියක් කුල දූෂක නොවී පැවත නැත. කවරෙකුට හෝ තම පරපුරේ නිර්මලත්වය ඔප්පු කිරීමට නොහැකි වෙයි. බ්‍රාහ්මණයන්ගේ නිර්මලත්වයට ප්‍රතිපක්ෂව ඉදිරිපත් වූ මෙම ඓතිහාසික සාදක දැක්වෙන්නේ,

i) වාසෙට්ඨ සූත්‍රයේය

ii) අග්ගඤ්ඤ සූත්‍රයේය

iii) බ්‍රහ්මජාල සූත්‍රයේය

iv) අම්බට්ඨ සූත්‍රයේය

v) අස්සලායන සූත්‍රයේය

16. බුදුරජාණන් වහන්සේ දැනගත යුතු සියලු ධර්ම දැනගෙන අවබෝධ කළ බැවින්ද, සාක්ෂාත් කළයුතු සියලු ධර්ම සාක්ෂාත් කළ යුතු බැවින්ද, වැඩිය යුතු සියලු ධර්ම වැඩූ බැවින්ද,

i) අරහං නම් වන සේක

ii) ලෝකවිදූ නම් වන සේක

iii) විජ්ජා චරණ නම් වන සේක

iv) සුගත නම් වන සේක

v) සම්මා සම්බුද්ධ නම් වන සේක

17. බුදුරජාණන් වහන්සේ තමන් වහන්සේගේම අදහසට අනුව දම්සක් පැවතුම් සූත්‍රය ඇසුරින් පස්වග තවුසන්ට දහම් දෙසූ සේක. මෙම නිදර්ශනය අදාළ වන දේශනා ක්‍රමය වන්නේ,

i) අත්තජ්ඣාසය

ii) පරජ්ඣාසය

iii) අට්ඨුප්පත්තික

iv) පුච්ඡාවසික

v) පටිපුච්ඡාව්‍යාකරණීය

18. ''පුණ්ඩරීකං යථා වග්ගු......'' යන ගාථාවෙන් බුදුරජාණන් වහන්සේ තුළ පැවති ශ්‍රේෂ්ඨ චරිත ලක්ෂණයක් පිළිඹිබු වේ. එනම්, උන්වහන්සේ තුළ පැවති,

i) මහා කරුණාවයි
ii) මහා ප්‍රඥාවයි
iii) ආදර්ශවත් නායකත්වයයි
iv) පත්මාකාර ජීවිතයයි
v) තාදී ගුණයයි

19. කොසොල් මහරජුගේ අසදෘශ දානය, උපාලි ගෘහපතිගෙන් ලැබුණු ප්‍රශංසා, මාගන්ධියා, සුන්දරීගෙන් ලැබුණු ආක්‍රොස පරිභාව, ජේතවනාරාමයෙන් ලද සැපත යනාදිය හමුවේ බුදුරජාණන් වහන්සේ ක්‍රියාකළ ආකාරය තුළින් අපට ගත හැකි ආදර්ශය වන්නේ,

i) යසෙද්දී සතුටු විය යුතු බවයි
ii) ප්‍රශංසා වලදී සතුටු විය යුතු බවයි
iii) නින්දාවේදී කෝප විය යුතු බවයි
iv) අයස හමුවේ දුක්විය යුතු බවයි
v) අටලෝ දහමින් අකම්පිත විය යුතු බවයි

20. ''බුදුරජාණන් වහන්සේ ලෞකික ආශා නැමැති ගිනිගත් නිවස තුළ දැවෙන දරුවන් බේරා ගැනීමට, මාර්ග යොදන්නා වූ ද, බේරා ගැනීමෙන් පසු, නිර්වාණය නැමති ආරක්ෂිත ස්ථානයට මග පෙන්වන්නා වූ ද, පියෙකු බඳුය. මෙම ප්‍රකාශය කරන ලද්දේ,

i) මැක්ස් වුලර්
ii) බර්ට්‍රන්ඩ් රසල්
iii) ලක්ෂ්මී නරසු
iv) ඇල්බට් අයින්ස්ටයින්
v) එඩ්වින් ආර්නෝල්ඩ්

21. තමන් වහන්සේ දහම් දෙසන්නේ වෙනත් ආගමිකයින් තමාගේ ශ්‍රාවකත්වයට හරවා ගැනීමේ අරමුණින් නොවන බව යන අදහස ඇතුළත් සූත්‍ර දේශනාව වන්නේ,

i) සිගාලෝවාද සූත්‍රය
ii) උදුම්බරික සීහනාද සූත්‍රය
iii) කාලාම සූත්‍රය
iv) වීමංසක සූත්‍රය
v) අරඤ්ඤක සූත්‍රය

22. බුදුරජාණන් වහන්සේගේ සෙසු ගුණාංග වලට වඩා මහා ප්‍රඥාව ශ්‍රේෂ්ඨ වන බව උන්වහන්සේම දේශනා කර ඇති සූත්‍රය වන්නේ,

i) මහා සකුළුදායි සූත්‍රය
ii) චූල්ලහත්ථිපදෝපම සූත්‍රය
iii) මහා සීහනාද සූත්‍රය
iv) දම්සක් පැවතුම් සූත්‍රය
v) රාහුලෝවාද සූත්‍රය

23. චිත්තගහපති උපාසකතුමාට ගැරහීම නිසා බුදුරජාණන් වහන්සේ විසින් ප්‍රථම වතාවට පාටිසාරණීය කර්මය පැනවූ භික්ෂුව වන්නේ,

i) උදායි භික්ෂුව
ii) සුභද්‍රා භික්ෂුව
iii) දේවදත්ත භික්ෂුව
iv) ඡන්න භික්ෂුව
v) සුධම්ම භික්ෂුව

24. සතර ඉරියව්වෙන් තොරව වීර්යය වඩා පළමු සංගායනාවට පෙර දින රහත් ඵලයට පත්වූ භික්ෂුව වන්නේ,

i) කාශ්‍යප මහතෙරුන්
ii) යස මහතෙරුන්
iii) උපාලි මහතෙරුන්
iv) ආනන්ද මහතෙරුන්
v) අනුරුද්ධ මහතෙරුන්

25. ධර්මඥානය හා අත්දැකීම් බහුලත්වය නිසා චිරරාතඥ භික්ෂුණීන් අතර අග්‍ර තනතුර හිමිවූයේ,

i) යසෝදරා තෙරණින් වහන්සේ
ii) ඛේමා තෙරණින් වහන්සේ
iii) පුණ්ණා තෙරණින් වහන්සේ
iv) මහා ප්‍රජාපතී ගෝතමී තෙරණින් වහන්සේ
v) උප්පලවණ්ණා තෙරණින් වහන්සේ

26. සම්බුදු සසුනේ ප්‍රඥා සම්පන්න භික්ෂුණීන් අතර අගතනතුර හිමිවූයේ,

i) ඛේමා තෙරණින් වහන්සේ
ii) මහා ප්‍රජාපතී ගෝතමී තෙරණින් වහන්සේ
iii) භද්දකච්චායනා තෙරණින් වහන්සේ
iv) යසෝදරා තෙරණින් වහන්සේ
v) උප්පලවණ්ණා තෙරණින් වහන්සේ

27. බුදු සසුනේ සකෘදාගාමී හා අනාගාමී ඵලයන්ට පත්වූ උපාසක උපාසිකාවන් දෙපල වන්නේ,

i) අනාථ පිණ්ඩික, විශාඛා
ii) සුජාතා, නකුල පිතා
iii) නකුලමාතා, චිත්ත ගහපති
iv) සුජාතා, අනාථ පිණ්ඩික
v) නකුල පිතා, විශාඛා

28. බුදුරජාණන් වහන්සේ ශ්‍රව්‍ය දෘශ්‍ය මාර්ග දෙකම උපයෝගී කරගෙන ධර්මය දේශනා කරනු ලැබුවේ,

i) ඛේමා උපාසිකාවටය
ii) බන්දුල මල්ලිකා උපාසිකාවටය
iii) සුජාතා උපාසිකාවටය
iv) සුමනා උපාසිකාවටය
v) උප්පලවණ්ණා උපාසිකාවටය

29. පුබ්බේකතහේතුවාදය යනු,

i) සියල්ල අහේතුකව සිදුවන බවය
ii) සියල්ල පෙර කරන ලද කර්මයට අනුව සිදුවන බවය
iii) සියල්ල හේතු ඵල දහම අනුව සිදුවන බවය
iv) සියල්ල අදෘශ්‍යමාන බලවේග වලින් සිදුවන බවය
v) සියල්ල නියතියකට අනුව සිදුවන බවය

30. සිය කැමැත්ත අනුව හොඳ නරක තමා විසින්ම තීරණය කොට ක්‍රියා කළ හැකි බව හැඳින්වෙන්නේ,

i) ස්වාමීත්වය යනුවෙන්ය
ii) ස්වාධීනත්වය යනුවෙන්ය
iii) ස්වච්ඡන්දතාවය යනුවෙන්ය
iv) ස්වාධිපත්වය යනුවෙන්ය
v) ස්වෛරීභාවය යනුවෙන්ය

31. සියලු සත්වයින්ට දැහැමි රැකවරණය සැලසීමත්, අපරාධ මර්දනය කිරීමත්, ආර්ථික සුරක්ෂිතතාව ඇති කිරීමත්, පූජනීය විශාරදයන්ගේ උපදෙස් ලබාගැනීමත් යන සිව් වැදෑරුම් කරුණු ඇතුළත් රාෂ්ට්‍ර පාලන මූලධර්මය වන්නේ,

i) පංචශීල ප්‍රතිපදාව
ii) දස රාජ ධර්මය
iii) සප්ත අපරිහාණිය ධර්ම
iv) දස සක්විතිවත්
v) සතර සංග්‍රහ වස්තු

32. සමගිය අගය කිරීම, නීති ගරුකත්වය හා සම්ප්‍රදාය ගරුකත්වය යන කරුණු ඇතුළත් වන රාෂ්ට්‍ර පාලන මූලධර්මය වනුයේ,

i) සතර බ්‍රහ්ම විහරණය
ii) සප්ත අපරිහාණීය ධර්මය
iii) පංච ශීලය
iv) සතර අගතියෙන් තොර බව
v) සතර සංග්‍රහ වස්තු

33. කූටදන්ත සූත්‍රය අනුව සාර්ථක රාජ්‍ය පාලකයෙකු වීමට අවශ්‍ය සුදුසුකමක් නොවන්නේ,

i) සිල්වත් බව
ii) යහපත් තෙපුල් ඇත්තෙකු වීම
iii) සමානාත්මතාවයෙන් යුක්ත වීම
iv) නුවණැත්තෙකු හා උගතෙකු වීම
v) ප්‍රසාදය එලවන සුළු තැනැත්තෙකු වීම

34. පොදු දේපළ පරිහරණයේදී සැලකිලිමත් විය යුතු කරුණක් නොවන්නේ,

i) තම වස්තුව සේ සලකා රැකබලා ගැනීම
ii) විනාශ වී යාමට ඉඩ නොදී නඩත්තු කිරීම
iii) අවභාවිත නොකිරීම
iv) අපතේ නොහැරීම
v) පුද්ගලික භාවිතයට ගැනීම

35. හොඳ නරක විනිශ්චය කිරීමෙහිලා අම්බලට්ඨක රාහුලෝවාද සූත්‍රයෙන් බුදුරජාණන් වහන්සේ දේශනා කර වදාළේ,

i) යම් ක්‍රියාවකට මුල්වන චේතනාව පිළිබඳව විමසිය යුතු බවය.
ii) තමා උපමා කොට අන්‍යයන් පිළිබඳව ක්‍රියා කළ යුතු බවය.
iii) තම කායික, වාචසික හා මානසික ක්‍රියා ප්‍රත්‍යවේක්ෂා කළ යුතු බවය.
iv) තමාට මෙන්ම අනුන්ට ද සිදුවන යහපත හා අයහපත පිළිබඳව සොයා බැලිය යුතු බවය.
v) අධිපති ධර්ම පිළිබඳව විමසිය යුතු බවය.

36. දස කුසලයන්හි යෙදීම යනු, කායිකව, වාචසිකව හා මානසිකව සිදු කරනු ලබන දශ විධ අකුසලයෙන් වෙන්ව කටයුතු කිරීමයි. එහි එන 'අභිධ්‍යාවෙන් වෙන්වීම' යනු,

i) කායික කුසලයකි
ii) වාචසික කුසලයකි
iii) මානසික කුසලයකි
iv) කායික හා මානසික කුසලයකි
v) කායික හා වාචසික කුසලයකි

37. දානපතිනියක වූ කුසලවතී උපාසිකාව ධර්මානුකූල වතාවත්හි යෙදෙමින්, නිරතුරුවම මියගිය මව්පියන්ට පින්පෙත් අනුමෝදන් කරමින් වාසය කරයි. සතර පෝයට සිල් සමාදන් වන ඇය ධර්මදේශනා සඳහා අනුග්‍රහ දක්වන අතර ධර්ම ශ්‍රවණයට ලැදිව කටයුතු කරයි. ඇය තුළින් වඩාත්ම ප්‍රකට වන ගුණාංගය වන්නේ,

i) ඇය සතර බ්‍රහ්ම විහරණයන්ගෙන් යුක්ත බවයි
ii) පන්සිල් සුරකින බවයි
iii) දස කුසල සීලයෙන් යුක්ත බවයි
iv) සතර සංග්‍රහ වස්තු අනුගමනය කරන බවයි
v) දස පින් කිරියාවත්වට අනුව ජිවත් වන බවයි

38. සිගාලෝවාද සූත්‍රගත සමාජ යුතුකම්වලට අනුව මෛත්‍රී සහගත සිතිවිලි වලින් සංග්‍රහ කළ යුත්තේ,

i) ගුරුවරුන්ට ය.
ii) මහණ බමුණන්ට ය.
iii) මිතුරන්ට ය.
iv) දෙමව්පියන්ට ය.
v) දැසි දස්සන්ට ය.

39. බෞද්ධ සමාජ ආචාර ධර්මවලට අනුව අත්තහිත පරහිත නමින් හැඳින්වෙන ක්‍රියා යහපත් ක්‍රියාලෙස බුදු සමය අගය කරයි. මේ අනුව තමාගේ මෙන් සමාජයේ යහපත පිණිස සෘජුව ඉවහල්වන සදාචාරමය ක්‍රියා වන්නේ,

i) දන්දීමයි
ii) පන්සිල් සුරකීමයි
iii) විදර්ශනා වැඩීමයි
iv) ළිං පොකුණු තැනීමයි
v) මං මාවත් තැනීමයි

40. සතර සංග්‍රහ වස්තුව ගිහිපැවිදි දෙපක්ෂය තුළ ද, එලෙසම යහපත් රාජ්‍ය පාලකයෙකු තුළ ද පැවතිය යුතු බෞද්ධ ප්‍රතිපදාවකි. එහි එන ''අත්ථචරියා'' යන්නෙන් අදහස් වනුයේ,

i) මෙරමාගේ දියුණුව පිණිස කටයුතු කිරීමයි
ii) ස්වාර්ථය පිණිස කටයුතු කිරීමයි
iii) ස්වාර්ථය හා පරාර්ථය පිණිස කටයුතු කිරීමයි
iv) සියලු දෙනාටම සමානව සැලකීමයි
v) ජනතාවගේ ආරක්ෂාව සඳහා කැපවීමයි

41. බුද්ධ රත්නය, ධම්ම රත්නය, සංඝ රත්නය යන තෙරුවන් ගුණ නිවැරදිව දැක දැන, එම අවබෝධය මත ඇති කර ගන්නා පැහැදීම,

i) භක්තිය නම් වේ
ii) සමාධිය නම් වේ
iii) අමූලිකා ශ්‍රද්ධාව නම් වේ
iv) ආකාරවතී ශ්‍රද්ධාව නම් වේ
v) සතිය නම් වේ

42. සැප කැමති සත්ත්වයෙකු වූ මිනිසා අසීමිත ආශාවන් පසු පස හඹා ගොස් දුකට පත් වේ. එනිසා පුද්ගල පරිහානිය සේම විවිධ සමාජ ගැටළු උද්ගත වේ.එයින් මිදීම සඳහා බුදු දහමින් අනුමත ක්‍රියාමාර්ගය වන්නේ,

i) අල්පේච්ඡතාව ප්‍රගුණ කිරීමයි
ii) පරිත්‍යාගශීලීව කටයුතු කිරීමයි
iii) කම්සුව විඳීමෙන් වැළකී සිටීමයි
iv) භෞතික සම්පත් අතහැර පැවිදි වීමයි
v) සම්පත් ඉපැයීම සිදු නොකිරීමයි

43. බුදු දහම නීතිගරුකත්වය අගය කරයි. දඬුවම ප්‍රතික්ෂේප නොකරන අතර, එය අපරාධ වැළැක්වීමේ එකම මග ලෙස නොපිළිගනී. නීති ගරුකත්වය හා සාමය පිළිබඳව බෞද්ධ ඉගැන්වීම්වලට අනුව පහත සඳහන් ප්‍රකාශ අතුරින් වඩාත්ම නිවැරදි වන්නේ,

i) දඬුවම් දීම සමාජ සදාචාරය පිණිස අත්‍යාවශ්‍ය සාධකයක් වන බවයි.
ii) පුද්ගලයා වරදට පොළඹවන හේතු නැති කොට අපරාධ නැති කළ යුතු බවයි.
iii) සදාචාර සම්පන්නවීම මගින් අපරාධ සියල්ල දුරු කළ යුතු බවයි.
iv) දඬුවම් ලබාදීම ප්‍රතික්ෂේප කරන බවයි.
v) නීතිගරුකත්වය අපරිහානීය ධර්මයක් ලෙස ඇගයීමට ලක් නොකරන බවයි.

44. බුදුරජාණන් වහන්සේ හා මහ රහතන් වහන්සේලා විසින් සොබා දහමේ චමත්කාරය වින්දනය කර ඇති ආකාරය බෞද්ධ මූලාශ්‍ර මගින් ප්‍රකට වේ. බුදු දහමට අනුව එම වින්දනය,

i) උපාදානාත්මක වින්දනයකි.
ii) අනුපාදානාත්මක වින්දනයකි.
iii) සෞන්දර්යාත්මක වින්දනයකි.
iv) ශෘංගාරාත්මක වින්දනයකි.
v) සුඛවේදනාත්මක වින්දනයකි.

45. උයන්වතු වැවීම, වන වගාව, ඒදඬු පාලම්, මංමාවත් තැනීම, ළිං පොකුණු තැනීම, උතුම් පින්කම් වන ''වනරෝප'' සූත්‍රයේ දැක්වේ. තවද ගස්වැල් හා බීජ සිඳීම, ජලයේ හෝ විවෘත පරිසරයේ මළමුත්‍රා කිරීම, කෙළ ගැසීම ආදිය සිදු නොකළ යුතු බව විනය නීති මගින් අවධාරණය කර ඇත. මෙම ඡේදයෙන් ප්‍රකාශ වන්නේ බුදුසමය,

i) ස්වභාව සෞන්දර්යය අගය කර ඇති බවයි.
ii) ජල කළමනාකරණය හා සංරක්ෂණය අත්‍යවශ්‍ය බවයි.
iii) සමාජ සත්කාරක සේවා නිවනට හේතු වන බවයි.
iv) වන වගාව අගය කර ඇති බවයි.
v) පරිසර සංරක්ෂණය ඉහළින් අගය කර ඇති බවයි.

46. තම ආර්ථික සංවර්ධනය සඳහා ගිහියා ධනෝපායනයේදී අසාහසිකත්වයෙන් හා උත්සහයෙන් වීර්යයෙන් යුක්තව ශ්‍රමය වැය කළ යුතු බව බුදුදහම අවධාරණය කරයි. එලෙස උපයා ගත් ධනය පරිහරණය කිරීම පිළිබඳව බුදුදහමට අනුව නොගැළපෙන වගන්තිය වනුයේ,

උපයා ගත් ධනය

i) යුතුකම් ඉටුකිරීම සඳහා වැය කළ යුතුය.

ii) සමජීවකතාවයෙන් පරිහරණය කළ යුතුය.

iii) තමාගේ හා අඹුදරුවන්ගේ සැපය සඳහා පමණක් යෙදවිය යුතුය.

iv) පංචබලි සඳහා යෙදවිය යුතුය.

v) ආපදාවකදී ලබා ගැනීමට නිධන් කළ යුතුය.

47. සිගාලෝවාද සූත්‍රයේ මනා කළමනාකාරීත්වයකින් යුක්තව ධනය පරිහරණය කිරීම සම්බන්ධව වටිනා උපදේශයක් සපයයි. එහිදී කියවෙන ''ද්වීහි කම්මං පයෝජයේ'' යන ගාථා පාඨයෙන් කියවෙන උපදේශය වනුයේ, තමා උපයාගත් ධනය කොටස් හතරකට බෙදා ඉන්,

i) එක් කොටසක් එදිනෙදා පරිභෝජනය පිණිස යෙදවිය යුතු බවය.

ii) කොටස් දෙකක් ඉදිරි කර්මාන්ත කටයුතුවල දියුණුව පිණිස ආයෝජනය කළ යුතු බවය.

iii) එක් කොටසක් ආපදාවකදී ගැනීම සඳහා නිධන් කළ යුතු බවය.

iv) කොටස් දෙකක් එදිනෙදා පරිභෝජනයට ගත යුතු බවය.

v) එක් කොටසක් කර්මාන්තාදියෙහි ආයෝජනයට කළ යුතු බවය.

48. මනා කළමණාකාරිත්වයකින් යුක්තව ධනය පරිහරණය කළ යුතු ආකාරය ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේ එන ''සමජීවකතාවයෙන්'' පැහැදිලි කෙරේ. ඒ අනුව,

i) අය වැය සමව පවත්වා ගත යුතුය.

ii) අයට වඩා වැය අඩු විය යුතුය.

iii) අයට වඩා වැය වැඩි විය යුතුය.

iv) වැය නොකළ යුතුය.

v) අය පමණක් කළ යුතුය.

49. යම් අරමුණක් ඉටු කර ගැනීම සඳහා කාර්යක්ෂමව හා ඵලදායි භෞතික හා මානව සම්පත් යොදා ගැනීම කළමනාකරණය ලෙස අර්ථ දැක්විය හැකිය. දෛනිකව කාලසටහනකට අනුව ක්‍රියාකිරීම, සාංඝික දේපල ක්‍රමය, සිවුරු භාවිතය ආදී අවස්ථාවන්හි දී බුදුසමයට අනුව ක්‍රියා කළ යුතු ආකාරය මගින් හඳුනාගත හැකි වනුයේ,

i) මානව සම්පත් කළමනාකරණය පිළිබඳවයි.

ii) භෞතික සම්පත් කළමනාකරණය පිළිබඳවයි.

iii) අධ්‍යාත්මික සම්පත් කළමනාකරණය පිළිබඳවයි.

iv) පිරිස් කළමනාකරණය පිළිබඳවයි.

v) පරිසර කළමනාකරණය පිළිබඳවයි.

50. බුදු දහම අනුව තමා දැහැමිව උපයාගත් ධනයෙන් විඳිය හැකි සැප 4ක් පිළිබඳව විස්තර කෙරේ. ඒ අනුව ''එදිනෙදා ජීවිතය තම යුතුකම් ඉටුකරමින් සාර්ථකව ගත කිරීමට අවශ්‍ය තරම් ප්‍රමාණවත් ධනයක් තමා සතුව පවතී'' යැයි ලැබිය හැකි සතුට හැඳින්වෙන්නේ,

i) අත්ථි සුඛ යනුවෙනි

ii) භෝග සුඛ යනුවෙනි

iii) අණන සුඛ යනුවෙනි

iv) අනවජ්ජ සුඛ යනුවෙනි

v) කාම සුඛ යනුවෙනි